# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2401/24 - 2024 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2024.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලද මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2024.09.10 දින සිට වලංගු විය යුතු ය.

ආර්. පී. ඒ. විමලවීර,
ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
"මෙහෙවර පියස",
කොළඹ 05.


1A - G 42688 — 54 (2024/09)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 31 වැනි දිනැති අංක 9441 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද අවසන්වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු**

| | | | |
|---|---|---|---|
| i. | අවම දෛනික වේතන ප්‍රමාණය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | - | රු. 1,350.00 |
| ii. | සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් කඩන සෑම තේ දළු කිලෝග්‍රෑම් 1ක් සඳහාම (Over kilo rate) | - | රු. 50.00 |

මෙම තීරණය 2024.09.10 දිනෙන් ආරම්භ වී වසර 03ක් දක්වා ක්‍රියාත්මක කිරීමට පඩිපාලක සභාව තීරණය කරන ලදී.

EOG 09 - 0097/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලද මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2024.09.10 දින සිට වලංගු විය යුතු ය.

ආර්. පී. ඒ. විමලවීර,
ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
"මෙහෙවර පියෙස",
කොළඹ 05.

*උපලේඛනය*

රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 නොවැම්බර් මස 25 වැනි දිනැති අංක 10047 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද අවසන්වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණවල II වැනි කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු**

| | | | |
|---|---|---|---|
| i. | අවම දෛනික වේතන ප්‍රමාණය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | - | රු. 1,350.00 |
| ii. | සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙනෙන සෑම රබර් කිරි කිලෝග්‍රෑම් 1ක් සඳහාම (Over kilo rate) | - | රු. 50.00 |

මෙම තීරණය 2024.09.10 දිනෙන් ආරම්භ වී වසර 03ක් දක්වා ක්‍රියාත්මක කිරීමට පඩිපාලක සභාව තීරණය කරන ලදී.

EOG 09 - 0097/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.